
මානව විද්‍යාව




# අතීතයෙන් ආ දැරිය


මානව වංශය ආරම්භයේ අරුණලු නැංවෙද්දී මෙලොවට බිහි වූ දැරිය තුන් හැවිරිදි DIKKA BABY හමුවීමට ඔබ කැමති ද ? ඇය සොයා ගැනීමත් සමඟ ළමා වියේ ආරම්භය පිළිබඳ කරුණු රැසක් ආනාවරණය කර ගැනීමට හැකි වී තිබේ.

ඉතියෝපියාවේ Rift නිම්නය ආසන්නයේ DIKKA ප්‍රදේශයෙන් ලැබු දැරියගේ වයස අවුරුදු තුනක් යැයි සනාථ කර තිබේ. ඇය වසර මිලියන 3.3 ක් වැලි-ගල් අතරේ සිරවී සිටි අතර විද්‍යා-ඥයෝ ඇයව ප්‍රවේසම් සහගතව, ඇළී සිටි ගලෙන් මතුකර ගත්හ. මානව වංශ කතාවේ අරුණැල්ලේ දී බිහි වූ දැරිය නැවතත් උපත ලද්දීය.

DIKKA අයත් වන්නේ Australopithecus afarensis නම් වන පොසිල විශේෂයට යි. එම වර්ගයේ ආරම්භක සාමාජිකාව වනුයේ වයර මිලියන 3.2 ක් වයස්ගත ලුසී නම් පොසිල කාන්තාවයි. ඇගේ පොසිල සොයා ගනු ලැබුවේ 1974 දී ය. එහෙත් ලුසී මෙන් නොව ඩිකිකාගේ සිරුරේ ඇඟිලි පාදයක් හා සම්පූර්ණ මිනිස් කදක කොටසක් (torso)තිබේ.Zeresenayනම් විද්‍යා-ඥයා පවසන පරිදි ඇගේ සුවිශේ-ෂත්වය නම් දැරියට මුහුණක් තිබීමයි. එකිනෙකා ගේ අස්ථි පොදියේ විශාලත්-වය කොමඩු ගෙඩියක් තරම් ය.




**ඩිකිකා දැරිය ඇයට පෙර සොයා ගනු ලැබූ AL 444 – 2 හා ලූසී යන පොසිල සමඟ එක් වී Australopithecus afarensis නම් පොසිල විශේෂය නිර්මාණය කරයි. එහෙත් මේ තිදෙනා අතරින් මානවයන්, වානර පවුලගෙන් වෙන් වීමේ අවස්ථා පිළිබඳ වැදගත් කරුණු හෙළි කරන්නේ ඩිකිකා ය. ඇයට පළල් උරතල තිබේ. ඒ ගෝරිල්ලකු ගේ ලක්ෂණ යි. එහෙත් ඇගේ ඉනෙන් පහළ කොටස නූතන මානව ලක්ෂණ පිළිඹිබු කරයි. ඇය බිම ඇවිදීම ද සිදු කර ඇත.**



එහෙත් දුරාතීන ළමාවිය මොළයේ වර්ධනය පිළිබඳ විද්‍යාත්මක කරුණු රැසක් ඇගෙන් හමු වේ. ඩිකිකාට එම නම තබන ලද්දේ ඇයව සොයා ගත් ප්‍රදේශය DIKKA නම් වන බැවිනි. ඇය සිටියේ හොළින් හැඩයක් ලෙස විකාශනය වී තිබූ කඳු ගැටයකය. මෙම කන්ද AWASH ගංගාව හරහා පිහිටියකි. ලූසී හා වෙනත් මානවයන් පිළිබඳ තොරතුරු සොයා ගත් ඉතියෝපියාවේ RIFT නිම්නය ද ඒ අසල ම පිහිටා තිබේ. මෙම කලාපය අධික උෂ්ණසුම, ගංවතුර, මැලේරියාව හා ශ්‍රෝත්‍ර ගැටුම්වලට ප්‍රසිද්ධ ය. සිංහයන්, හයිනාවන් හමුවීම ද වැළැක්විය නොහැකි ය. මෙම ප්‍රදේශය පොසිල කැනීමට ඉතා අසීරු ප්‍රදේශයයක් වන අතරම, වඩා සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන්නක් බව ද කිව යුතුය.

1999 දී ZERESENAY ඇතුළු විද්‍යාඥයෝ පිරිසක් RIFT නිම්න කලාපය ගවේෂණය කිරීම ආරම්භ කළේ ය. 2000 වසරේ දෙසැම්බර් මාසය වන විට අලි, හිපොපොටේමස්, රයිනෝසිරස් හා ඇන්ටිලෝපයන් වැනි සතුන්ගේ පොසිල සොයා ගැනීමට ඔවුහු සමත් වූහ. එහෙත් මානව පොසිල ඒ අතර නොවීය. එහෙත් විද්‍යාඥයන් පිරිස තම උත්සාහය අත්හැරියේ නැත. දූවිලි නැහැවුණු බෑවුමකින් ඉදිරියට නෙරා තිබූ ඩිකිකාගේ කුඩා මුහුණ පළමුවෙන්ම දුටුවේ Tilahum Gebreselassie නම් විද්‍යාඥයා ය. එය වඳුරකුගේ මුහුණක් වැනි විය. සිනිඳු නළල් තලයක් ද, කෙටි රදනක දත් ද ඩිකිකාට තිබිණි. විද්‍යාඥයන් පිරිස මවිතයට පත් වූයේ දැරියගේ සැකිල්ල අංග සම්පූර්ණ බව දැකීමෙන් නොව, ඇයගේ සැකිල්ලත් හිසත් සම්බන්ධ කර හිස පිටුපසින් වැලි ගල් කුට්ටියක් රඳවා තබා තිබීම දැකීමෙනි.

ඩිකිකා මිය ගියේ කෙසේදැයි විද්‍යාඥයෝ නොදත්හ. එහෙත් එළැඹිය හැකි එක් උපකල්පනයක් නම්; ගංගාව ගලා ඇයව පතුලේ තැන්පත් වී බොරළු හා වැලිවලින් වසා දමන්නට ඇත යන්නය්. එමඟින් ඩිකිකා කසළ භක්ෂක මාළුන්ගෙන් ආරක්ෂා වී ක්‍රමයෙන් ගල් පර්වතයට තද වන්නට ඇත.

ගලෙන් පොසිල කොටස් ඉවත් කර ගැනීම විද්‍යාඥයන් පිරිසට අසීරු විය. ඉතා කුඩා ශෛල අංශූ ඈත මෑත් කරමින් එය කළ යුතු විය. මේ දක්වා ඔවුනට එය ඉවත් කිරීමට වසර පහක් ගත වී තිබේ.

කිරි දත් මෙන්ම,පිටතට නොපැමිණි වැඩිහිටි දත් ද ඩිකිකා සතු විය. ඇගේ කුඩා ඉල ඇට නිසි ආකාරව සජීවී අයකුගේ මෙන් එක්වූ කශේරුකාවක පිහිටා තිබිණි. ඇය එක් ඇඟිල්ලක් නවාගෙන සිටියා ය. Zeresenay ඇගේ අස්ථිවලින් සොයා ගත් දුර්ලභ ම දෙය වූයේ. පසු කලෙක කථනය සඳහා මිනිසාට උදව් වූ අස්ථියකි. එය මිනිස් කථනයේ ආරම්භක අවස්ථාවක් වශයෙන් විද්‍යාඥයෝ විග්‍රහ කරති.

ඩිකිකාගේ ඉනෙන් පහළ කොටස් වත්මන් මිනිසකු ගේ කොටස්වලට සමාන ය. දණිස් ඇටය ඉතා කුඩාවට පිහිටා තිබේ. එහෙත් ඇගේ ඉනෙන් ඉහළ ප්‍රදේශය (ලූසීගේ මෙන්) වානර ලක්ෂණ පෙන්වයි. ඩිකිකා සතුවන්නේ ඉතා කුඩා මොළයක් වන අතර, ඇගේ නාසය චිම්පන්සියකුගේ මෙන් පැතලි ය. දිගු මුහුණ ඉදිරියට නෙරා ගොසිනි.

දිගු ඇඟිලි අස්ථි වක්‍රය. ඩිකිකා ගේ උරහිස් තල, කුඩා ගෝරිල්ලකු ගේ උරහිස් තලවලට නෑකම් කියයි. එමඟින් ඇයට ගස්වලට නැඟීමට පහසු වන්නට ඇත. කෙසේ වුවත් ඩිකිකා ඇගේ අනිකුත් වානර ඥාතීන්ට වඩා බොහෝ වෙනස් ය.

ඩිකිකා ගේ පොසිලවලින් අනාවරණය වන අන්දමට, ඇගේ මොළයේ වර්ධනය සිදුවී ඇත්තේ ඉතා සෙමිනි. ඇගේ මොළයේ පරිමාව කියුබික් සෙන්ටිමීටර 330 කි.







එය තුන් හැවිරිදි චිම්පන්සි පැටවකු ගේ මොළය හා සමාන ය. Zeresenay විශ්වාස කරන අන්දමට මොළය පරිණත වීමට ඉතා දිගු කලක් ගතවී තිබේ. එහෙත් කෙටි ජීවිතකාලයක් සහිත සත්ත්වයකුට විශාල මොළයක් අවශ්‍ය නැත. කෙසේ වුවත්, කාලය ගත වන විට මිනිස් වානරයින් ගේ ජීවිත කාලය අනෙක් වානරයන්ගේ ජීවිත කාලයට වඩා දිගු වන්නට විය.


ඩිකිකා දැරිය ගේ ජීවිත කතාව කෙටි ය. එහෙත් ඇගේ පොසිල දුරාතීත කාලයේ විසූ දරුවන් පිළිබඳ තොරතුරු අපට ලබා දෙයි. නව තාක්ෂණය නිපැදවීම ශිෂ්ටාචාර ගොඩනැංවීම හා විශේෂයෙන්ම, අප ගේ අතීත වංශ කතාව ගොඩනැංවීම ආදී සුවිසල් මෙහෙවරක් ඉටු කතරන මානවයින් බිහි කිරීමට ඇය දායකත්වය ලබා දී තිබේ.

**නැෂනල් ජියොග්‍රැෆික් ඇසුරෙනි**

**දිනිති නිස්සංක**







**මිනිස් ළදරුවන් මෙන් Dikika ළදැරිය ද මව විසින් ඔසවා ගනු ලැබ සංචාරය කරන්නට ඇත. එහෙත් ඇයට තුරුමත ද වාසය කිරීමට හැකියාව තිබී ඇති බව පොසිලවලින් අනාවරණය වේ. ඩිකිකා තවමත් වැලි ගල් තුළින් මතුවෙමින් සිටියි. ඇගේ පා ඇඟිලි තවමත් නිරාවරණය කරගෙන නැත.**